මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk
ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021 ජූලි 14 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2021 මැයි

## සමස්ත නිරීක්ෂණ

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වෙළඳ ගිණුමේ හිඟය 2021 වසරේ මැයි මාසයේ දී අඛණ්ඩව තෙවන වරටත් පුළුල් විය. 2020 වසරේ මැයි මාසයට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී අපනයන මෙන්ම ආනයන ද සැලකිය යුතු ලෙස ඉහළ අගයක පැවතුණු අතර, මීට වසරකට පෙර වසංගතය ආශ්‍රිත අවහිරතා හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. පෙර මාසයට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී අපනයන ඉපැයීම් ඉහළ ගිය අතර, ආනයන වියදම් පහළ ගියේය. මෙම මාසය තුළ දී, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඛණ්ඩව ඉහළ ගිය අතර, සංචාරක අංශයේ ඉපැයීම් අවම මට්ටමක පැවතුණි. මූල්‍ය ගිණුම සැලකීමේ දී, 2021 වසරේ මැයි මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ගෙවීම් සුළු ප්‍රමාණයක් වාර්තා විය. මේ අතර, ශ්‍රී ලංකා රුපියල මාසය පුරාම සමස්තයක් ලෙස ස්ථාවරව පැවති අතර, 2021 වසරේ මැයි මාසය අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 4.0ක් විය.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2020 මැයි එ.ජ.ඩො. මිලියන | 2021 මැයි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2020 ජන.-මැයි එ.ජ.ඩො. මිලියන | 2021 ජන.- මැයි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 587 | 892 | 52.0 | 3,519 | 4,692 | 33.3 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 994 | 1,607 | 61.7 | 6,619 | 8,356 | 26.2 |
| වෙළඳ ශේෂය | -407 | -716 | | -3,101 | -3,663 | |
| සංචාරක ඉපැයීම් | - | 2 (ඇ) | - | 682 (ආ) | 21 (ඇ) | -97.0 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 432 | 460 | 6.6 | 2,407 | 2,846 | 18.2 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -36 | -12 | | -64 | -119 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 121 | 7 (ඉ) | | 1,092 | 877 (ඊ) | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (දළ) | 2 | 7 | | 86 | 14 | |
| දිගුකාලීන ණය (දළ) | 118 | ලැනො. | | 1,006 | 863 (ඊ) | |
| විදේශ සෘජු ආයෝජන (උ) | | | | 188 | 198 | |
| සමස්ත ශේෂය | | | | -797 | -1,053 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) 2021 මැයි මාසයේදී රාජ්‍ය අංශයේ දළ ලැබීම් දත්ත අතරට විදේශීය ණය ඇතුළත් නොවේ.
(ඊ) දිගු කාලීන ණය සඳහා සමුච්චිත දත්තවලට විදේශීය ණය ඇතුළත් වන්නේ 2021 අප්‍රේල් මාසය දක්වා පමණි.
(උ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## වෙළඳ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

**වෙළඳ ශේෂය: වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වෙළඳ ගිණුමේ හිඟය අඛණ්ඩව තෙවන මාසයටත් ඉහළ ගිය අතර, 2020 වසරේ මැයි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 407ට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 716ක් දක්වා පුළුල් විය.** 2020 වසරේ මැයි මාසයට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී අපනයන ආදායම ඉහළ යෑම අභිබවා ආනයන වියදම විශාල වශයෙන් ඉහළ යෑම වෙළඳ හිඟය පුළුල් වීමට හේතු විය. කෙසේ වෙතත්, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 889ට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී මාසික ලක්ෂ්‍යමය පදනම මත වෙළඳ හිඟය පහළ ගියේය. 2021 වසරේ ජනවාරි සිට මැයි දක්වා කාලපරිච්ඡේදය තුළ සමස්ත වෙළඳ හිඟය, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,101ක සිට එ.ජ. ඩොලර් මිලියන 3,663ක් දක්වා පුළුල් විය. වෙළඳ ගිණුමේ සමස්ත හිඟය ඉහළ යෑම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

**වෙළඳ මිල අනුපාතය:** අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2020 වසරේ මැයි මාසයට සාපේක්ෂව 2021 වසරේ මැයි මාසයේ දී සියයට 11.5කින් පහළ ගිය අතර, ආනයන මිල ගණන් ඉහළ යෑම සහ අපනයන මිල ගණන් පහළ යෑම මේ සඳහා හේතු විය.

**රූප සටහන** 1: **2021 වසරේ ජනවාරි - මැයි කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑම සඳහා දායක වූ ප්‍රධාන අයිතම (අගයයන් එ.ජ. ඩොලර් මිලියනවලිනි)**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2020 -2021)**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව,ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2020 -2021)**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

**සමස්ත අපනයන**: **සියලුම ප්‍රධාන අංශවල අපනයන ඉහළ යෑම හේතුවෙන් වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, 2020 වසරේ මැයි මාසයට සහ 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2021 වසරේ මැයි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 892ක් දක්වා, පිළිවෙළින් සියයට 52.0කින් සහ සියයට 9.0කින් ඉහළ ගියේය.** 2021 වසරේ ජනවාරි සිට මැයි දක්වා සමස්ත අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 4,692ක් දක්වා 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 33.3ක වර්ධනයක් පෙන්නුම් කළ අතර**,** ඒ සඳහා 2020 වසරේ මුල් මාසවල ආර්ථික සහ සමාජ කටයුතු සීමා කිරීම් පැනවීම හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම විශාල වශයෙන් හේතු විය.

**කාර්මික අපනයන**: සියලුම උප අංශවල අපනයන වර්ධනයන් සමඟ 2021 වසරේ මැයි මාසයේ දී**,** කාර්මික භාණ්ඩ අපනයනය ආදායම 2020 වසරේ මැයි මාසයට සාපේක්ෂව ඉහළ වර්ධනයක් වාර්තා කළේය. බොහෝ උප අංශවල වාර්තා වූ පුළුල් වර්ධනය හේතුවෙන් 2021 වසරේ මැයි මාසයේ දී කාර්මික අපනයන ආදායම මාසික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.2කින් ඉහළ ගියේය. 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී රබර් නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් රබර් ටයර් සහ අත්වැසුම්); යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ (ප්‍රධාන වශයෙන් ඉලෙක්ට්‍රොනික උපකරණ); රෙදිපිළි සහ ඇඟලුම් (ප්‍රධාන වශයෙන් යුරෝපා සංගමයට අයත් රටවල් වෙත සිදු කළ ඇඟලුම් අපනයන); රසායනික නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් සක්‍රිය කාබන්) සහ මූල ලෝහ අපනයන ඉහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, මෙම කාලපරිච්ඡේදය තුළ මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත; මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ; ඛනිජ තෙල් නිෂ්පාදිත; සහ සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ සහ පාවහන් අපනයන පහළ යෑමක් වාර්තා කළේය. නැව් සහ ගුවන්යානා සඳහා භාවිත කරන ඉන්ධන

අපනයන ආදායම ඉහළ ගිය ද, ප්‍රධාන වශයෙන්ම නැප්තා වැනි වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන පහළ යෑම හේතුවෙන් 2021 වසරේ මැයි මාසයේ දී ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම මාසික ලක්ෂ්‍යමය පදනම මත පහළ ගියේය.

**කෘෂිකාර්මික අපනයන**: 2021 වසරේ මැයි මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම 2020 වසරේ මැයි මාසයට සාපේක්ෂව සියයට 8.9කින් ඉහළ ගියේය. මුහුදු ආහාර, ස්වාභාවික රබර් සහ සකස් නොකළ දුම්කොළ හැර කෘෂිකාර්මික අපනයනවල සියලුම උප අංශ අපනයන මාසික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ ගියේය. අපනයන මිල ගණන්වල සාමාන්‍යයෙහි සුළු පහළ යෑමක් පැවතිය ද, අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී තේ අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මීට අමතරව, කුළුබඩු අපනයනයෙන් ලද ආදායම (ප්‍රධාන වශයෙන් කුරුඳු, සාදික්කා සහ වසාවාසි), පොල් (මද ආශ්‍රිත පොල් නිෂ්පාදිත මෙන්ම මද ආශ්‍රිත නොවන පොල් නිෂ්පාදිත) සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත 2021 වසරේ මැයි මාසයේ දී මාසික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය විය.

**ඛනිජ අපනයන**: 2020 වසරේ මැයි මාසයට සහ 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී ඛනිජ අපනයන ආදායම ඉහළ ගියේය. පාෂාණ සහ ගල් වර්ග (ප්‍රධාන වශයෙන් ග්‍රැනයිට් සහ මිනිරන් කුඩු) අපනයනයෙන් ලද ඉහළ අදායම 2021 වසරේ මැයි මාසයේ දී ඛනිජ අපනයන ආදායම මාසික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය වීම සඳහා හේතු විය.

**අපනයන දර්ශක:** 2021 වසරේ මැයි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන පරිමා දර්ශකය සියයට 54.7කින් ඉහළ ගිය අතර, ඒකක මිල දර්ශකය සියයට 1.8කින් පහළ ගියේය. මෙමගින්, අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය සඳහා අපනයන පරිමා ඉහළ යෑමේ බලපෑම හේතු වූ බව නිරූපණය වේ.

**රූප සටහන 4**: **මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5**: **මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | මැයි 2020 (එ.ජ.ඩො. මිලියන) | මැයි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- මැයි 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.- මැයි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **401.0** | **687.0** | **71.3** | **2,695.8** | **3,636.4** | **34.9** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 29.3 | 38.9 | 32.9 | 156.1 | 206.3 | 32.1 |
| සත්ත්ව ආහාර | 8.2 | 11.3 | 38.2 | 37.9 | 50.2 | 32.3 |
| රෙදිපිළි හා ඇඟලුම් | 220.1 | 372.4 | 69.2 | 1,540.2 | 2,071.9 | 34.5 |
| එයින්, ඇඟලුම් | 189.1 | 334.9 | 77.0 | 1,411.2 | 1,890.9 | 34.0 |
| රෙදිපිළි | 15.0 | 27.6 | 83.6 | 85.1 | 126.5 | 48.7 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 16.0 | 10.0 | -37.6 | 44.0 | 54.5 | 23.9 |
| රබර් නිෂ්පාදිත | 49.4 | 88.9 | 80.1 | 269.7 | 406.8 | 50.8 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 6.8 | 16.0 | 133.5 | 61.6 | 111.0 | 80.2 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 20.8 | 40.9 | 96.3 | 116.3 | 196.9 | 69.4 |
| ප්‍රවාහන උපකරණ | 4.1 | 7.9 | 94.1 | 23.2 | 42.0 | 80.9 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 10.6 | 33.3 | 213.7 | 202.8 | 155.4 | -23.4 |
| රසායනික නිෂ්පාදිත | 13.9 | 19.6 | 40.8 | 59.3 | 87.8 | 48.1 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 7.1 | 9.7 | 36.7 | 36.4 | 49.4 | 35.7 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.4 | 2.1 | 46.7 | 13.1 | 24.1 | 83.7 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 2.6 | 2.9 | 11.6 | 20.2 | 17.8 | -11.8 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 3.5 | 5.7 | 62.5 | 19.8 | 29.9 | 50.9 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 8.1 | 13.3 | 64.5 | 45.8 | 55.3 | 20.8 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 1.2 | 2.9 | 146.7 | 7.6 | 14.3 | 86.6 |
| වෙනත් කාර්මික අපනයන | **13.8** | **21.1** | **52.7** | **85.6** | **117.3** | **37.0** |
| **2. කෘෂිකාර්මික අපනයන** | **183.0** | **199.3** | **8.9** | **809.8** | **1,028.7** | **27.0** |
| තේ | 108.3 | 109.2 | 0.9 | 456.7 | 526.6 | 15.3 |
| රබර් | 1.8 | 2.3 | 24.4 | 10.6 | 17.6 | 66.9 |
| පොල් | 27.9 | 34.0 | 22.2 | 112.6 | 157.7 | 40.1 |
| කුළුබඩු | 19.3 | 25.2 | 30.5 | 82.4 | 161.3 | 95.9 |
| එළවළු | 1.9 | 1.9 | 1.5 | 9.9 | 10.3 | 3.4 |
| සකස් නොකළ දුම්කොළ | 2.2 | 1.7 | -21.6 | 8.2 | 13.1 | 59.2 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 10.2 | 9.9 | -2.7 | 54.7 | 51.5 | -5.8 |
| මුහුදු ආහාර | 11.5 | 15.0 | 30.5 | 74.8 | 90.6 | 21.1 |
| **3. ඛනිජ අපනයන** | **2.2** | **4.5** | **99.0** | **8.1** | **20.4** | **152.2** |
| **4. වර්ග නොකළ අපනයන** | **0.5** | **1.0** | **123.2** | **4.9** | **6.6** | **34.8** |
| **මුළු අපනයන** | **586.7** | **891.7** | **52.0** | **3,518.6** | **4,692.0** | **33.3** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරීත්වය

**සමස්ත ආනයන: 2021 වසරේ මැයි මාසයේ වෙළඳ භාණ්ඩ ආනයන වියදම, 2020 වසරේ මැයි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 994ක සිට එ.ජ. ඩොලර් මිලියන 1,607ක් දක්වා සියයට 61.7කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** කෙසේ වෙතත්, 2021 වසරේ අප්‍රේල් මාසයේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,707ට සාපේක්ෂව 2021 වසරේ මැයි මාසයේ ආනයන වියදම පහළ අගයක පැවති අතර, සියලුම ප්‍රධාන ආනයන අංශවල ආනයන වියදම පහළ අගයක පැවතීම එයට හේතු විය. මේ අතර, 2021 වසරේ ජනවාරි සිට මැයි දක්වා සමස්ත ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 8,356ක් වූ අතර, එය 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 26.2ක වර්ධනයකි.

**පාරිභෝගික භාණ්ඩ:** ආහාර හා පාන වර්ග සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන දෙ අංශයහේම ආනයන වියදම 2021 වසරේ මැයි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත (සියයට 4.1කින්) මෙන්ම මාසික ලක්ෂ්‍යමය පදනම මත (සියයට 9.0කින්) පහළ ගියේය. 2021 වසරේ මැයි මාසය තුළ ආහාර හා පාන වර්ග කාණ්ඩය යටතේ වර්ග කර ඇති සීනි සහ රසකැවිලි (ප්‍රධාන වශයෙන් උක් සීනි); පළතුරු (ප්‍රධාන වශයෙන් ඇපල් සහ වියළි පළතුරු); සහ කිරි ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් කිරිපිටි සහ චීස්) ආනයන වියදම පසුගිය මාසයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වෙතත්, 2021 වසරේ මැයි මාසයේ දී, එළවළු (ප්‍රධාන වශයෙන් පරිප්පු සහ ළූණු); තෙල් සහ මේද වර්ග (ප්‍රධාන වශයෙන් පොල්තෙල්); කුළුබඩු (ප්‍රධාන වශයෙන් මිරිස් සහ කොත්තමල්ලි ඇට) සහ මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන් කල්තබා ගත හැකි ලෙස සකස් කළ මාළු) ආනයන වියදම මාසික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ ගියේය. 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2021 වසරේ මැයි මාසයේ දී ආහාර නොවන පාරිභෝගික කාණ්ඩයට අදාළ බොහෝ උප අංශවල ආනයන වියදම පහළ ගිය අතර, ගෘහ උපකරණ (ප්‍රධාන වශයෙන් ශීතකරණ සහ රූපවාහිනි යන්ත්‍ර); බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත සහ රෙදිපිළි සහ උපාංග සඳහා වන වියදම පහළ යෑම ඒ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය.

**අන්තර් භාණ්ඩ:** වසරකට පෙර පැවති මට්ටමට සාපේක්ෂව 2021 වසරේ මැයි මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම සියයට 115.0කින් ඉහළ ගිය ද, පෙර මාසයට සාපේක්ෂව සියයට 2.8කින් පහළ ගියේය. 2021 වසරේ මැයි මාසයේ දී ඉන්ධන; පොහොර (ප්‍රධාන වශයෙන් යූරියා); තිරිඟු සහ ඉරිඟු; රථ වාහන හා යන්ත්‍රසූත්‍ර කොටස් (ප්‍රධාන වශයෙන් මෝටර් රථ වාහන කොටස්); සහ රබර් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ආනයන වියදම පහළ ගිය අතර, මූල ලෝහ (ප්‍රධාන වශයෙන් යකඩ හා වානේ); රසායනික නිෂ්පාදිත; ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත; සහ රෙදිපිළි සහ රෙදිපිළි උපාංග සඳහා වන ආනයන වියදම මාසික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ ගියේය. 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී බොරතෙල්, පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරු ඇතුළු ඉන්ධන සඳහා වන ආනයන වියදම පහළ ගිය අතර, ආනයන මිල ගණන් ඉහළ ගිය ද ආනයන පරිමා පහළ යෑම මේ සඳහා හේතු විය. 2021 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් 66.44ක් වූ බොරතෙල් බැරලයක ආනයන මිලෙහි සාමාන්‍යය, 2021 වසරේ මැයි

මාසයේ දී එ.ජ. ඩොලර් 68.47ක් දක්වා ඉහළ ගියේය (2020 වසරේ මැයි මාසයේ දී බොරතෙල් බැරලයක් සඳහා ආනයන මිලෙහි සාමාන්‍යය එ.ජ. ඩොලර් 25.44ක් විය). එසේම, පිරිපහදු කළ ඛනිජ තෙල් මෙට්‍රික් ටොන් එකක ආනයන මිලෙහි සාමාන්‍යය, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් 571.23ට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී එ.ජ.ඩොලර් 593.83ක් දක්වා ඉහළ ගියේය (2020 වසරේ මැයි මාසයේ දී පිරිපහදු කළ ඛනිජ තෙල් මෙට්‍රික් ටොන් එකක ආනයන මිලෙහි සාමාන්‍යය එ.ජ. ඩොලර් 291.38ක් විය).

**ආයෝජන භාණ්ඩ:** ආයෝජන භාණ්ඩ ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 27.9කින් ඉහළ ගිය නමුත්, මාසික ලක්ෂ්‍යමය පදනම මත සියයට 12.7කින් පහළ ගියේය. 2021 වසරේ මැයි මාසයේ දී මාසික ලක්ෂ්‍යමය පදනම මත ආනයන පහළ යෑම සඳහා යන්ත්‍රසූත්‍ර සහ උපකරණ (ප්‍රධාන වශයෙන් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කොටස්, පොම්ප, ඉංජිනේරු උපකරණ) මෙන්ම ප්‍රවාහන උපකරණ (ප්‍රධාන වශයෙන් ලොරි රථ) සඳහා වන ආනයන වියදම පහළ යෑම හේතු විය. කෙසේ වෙතත්, 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී යකඩ, වානේ සහ ඒ ආශ්‍රිත උපාංග වැනි ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වන වියදම මෙන්ම, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ යටතේ වර්ග කර ඇති සම්ප්‍රේෂණ උපකරණ; ඉලෙක්ට්‍රොනික ඒකාබද්ධ පරිපථ සහ වෛද්‍ය සහ රසායනාගාර උපකරණ සඳහා වන වියදම ඉහළ ගියේය.

**ආනයන දර්ශක:** 2021 වසරේ මැයි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය පිළිවෙලින් සියයට 45.7කින් සහ සියයට 11.0කින් ඉහළ ගියේය. මෙමගින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන වියදම වර්ධනය වීම සඳහා ආනයන පරිමා සහ මිල ගණන් ඉහළ යෑමේ ඒකාබද්ධ බලපෑම හේතු වූ බව නිරූපණය වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | මැයි 2020 (එ.ජ.ඩො. මිලියන) | මැයි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-මැයි 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.-මැයි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **264.4** | **253.6** | **-4.1** | **1,533.0** | **1,530.1** | **-0.2** |
| ආහාර හා පාන වර්ග | **122.1** | **121.0** | **-0.9** | **685.4** | **749.8** | **9.4** |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.8 | 3.2 | 73.6 | 15.7 | 16.0 | 1.5 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 36.0 | 23.7 | -34.1 | 160.1 | 138.6 | -13.4 |
| එළවළු (ආ) | 30.3 | 33.5 | 10.6 | 175.9 | 171.5 | -2.5 |
| මුහුදු ආහාර | 19.5 | 10.0 | -49.0 | 84.9 | 43.1 | -49.2 |
| සීනි හා රසකැවිලි | 15.1 | 15.5 | 2.7 | 103.5 | 182.9 | 76.8 |
| කුළුබඩු | 9.6 | 12.1 | 26.0 | 59.8 | 59.5 | -0.4 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 9.8 | 23.0 | 135.8 | 85.6 | 138.2 | 61.5 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | **142.3** | **132.6** | **-6.8** | **847.6** | **780.2** | **-8.0** |
| පෞද්ගලික රථවාහන | 47.5 | 0.5 | -99.0 | 264.2 | 4.0 | -98.5 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 49.0 | 41.1 | -16.2 | 213.8 | 233.4 | 9.2 |
| ගෘහ උපකරණ | 10.2 | 15.4 | 50.6 | 76.7 | 113.0 | 47.3 |
| රෙදිපිළි හා උපාංග | 8.1 | 15.4 | 88.7 | 93.5 | 90.3 | -3.4 |
| විදුලි සංදේශ උපකරණ | 9.0 | 26.8 | 198.5 | 72.0 | 163.8 | 127.5 |
| ගෘහ හා දැව භාණ්ඩ | 8.9 | 11.5 | 28.9 | 57.2 | 65.0 | 13.6 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 9.6 | 22.0 | 130.4 | 70.2 | 110.8 | 57.8 |
| **2. අන්තර් භාණ්ඩ** | **486.3** | **1,045.4** | **115.0** | **3,602.0** | **5,111.1** | **41.9** |
| ඉන්ධන | 62.9 | 330.5 | 425.5 | 1,133.0 | 1,720.9 | 51.9 |
| එයින්, බොරතෙල් | 15.4 | 92.8 | 501.5 | 224.6 | 317.0 | 41.2 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 47.5 | 237.7 | 400.8 | 782.0 | 1,277.3 | 63.3 |
| ගල්අඟුරු | 0.0 | 0.0 | 788.9 | 126.3 | 126.6 | 0.2 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 5.1 | 8.2 | 61.0 | 32.3 | 51.7 | 60.1 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 121.0 | 235.7 | 94.7 | 889.9 | 1,174.3 | 32.0 |
| කඩදාසි හා ඝන කඩදාසි | 29.2 | 42.6 | 46.0 | 149.2 | 189.4 | 26.9 |
| කෘෂිකාර්මික යෙදවුම් | 16.7 | 22.4 | 34.6 | 86.0 | 109.0 | 26.8 |
| තිරිඟු හා ඉරිඟු | 39.8 | 20.8 | -47.8 | 128.7 | 141.0 | 9.6 |
| මූල ලෝහ | 20.8 | 102.8 | 393.4 | 157.7 | 297.0 | 88.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 31.5 | 64.9 | 106.4 | 199.4 | 322.7 | 61.8 |
| රසායනික නිෂ්පාදිත | 60.5 | 100.9 | 66.8 | 316.0 | 465.5 | 47.3 |
| පොහොර | 29.8 | 13.0 | -56.3 | 84.8 | 95.2 | 12.3 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 15.9 | 27.9 | 75.2 | 96.5 | 161.3 | 67.2 |
| ඛනිජ නිෂ්පාදිත | 7.7 | 15.9 | 106.7 | 60.1 | 60.4 | 0.5 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 45.4 | 59.7 | 31.4 | 268.5 | 322.7 | 20.2 |
| **3. ආයෝජන භාණ්ඩ** | **240.9** | **308.1** | **27.9** | **1,474.3** | **1,711.2** | **16.1** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 158.1 | 183.2 | 15.9 | 843.6 | 1,096.2 | 30.0 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 57.8 | 101.1 | 74.9 | 417.2 | 482.9 | 15.7 |
| ප්‍රවාහන උපකරණ | 24.8 | 23.3 | -6.2 | 212.3 | 131.0 | -38.3 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.1 | 0.5 | 221.5 | 1.2 | 1.1 | -9.0 |
| **4. වර්ග නොකළ ආනයන** | **2.2** | **0.3** | **-88.4** | **9.9** | **3.0** | **-69.1** |
| **මුළු ආනයන** | **993.8** | **1,607.4** | **61.7** | **6,619.1** | **8,355.5** | **26.2** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **930.9** | **1,276.9** | **37.2** | **5,486.2** | **6,634.6** | **20.9** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

**2021 වසරේ මැයි මාසය තුළ දී ද විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළේය**. ඒ අනුව, 2021 වසරේ මැයි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත එ.ජ. ඩොලර් මිලියන 460ක් දක්වා සියයට 6.6කින් වර්ධනය විය. වසරේ පළමු මාස පහ තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත එ.ජ. ඩොලර් මිලියන 2,846ක් දක්වා සියයට 18.2ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනය සඳහා පහළ පදනම් අගය මගින් ඇති වූ බලපෑම ප්‍රධාන විය.

**2021 වසරේ මැයි මාසයේ දී සංචාරක අංශය තුළ සීමිත සංචාරක පැමිණීම් ප්‍රමාණයක් වාර්තා විය.** 2021 වසරේ අප්‍රේල් මාසයේ 4,168ක් වූ සංචාරක පැමිණීම් ප්‍රමාණයට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී පැමිණි සංචාරකයින් ප්‍රමාණය 1,497ක් විය. 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැමිණි 507,311ක් වූ සංචාරකයින් ප්‍රමාණයට සාපේක්ෂව, 2021 වසරේ පළමු මාස පහ තුළ මුළු සංචාරක පැමිණීම් ප්‍රමාණය 15,294ක් ලෙස වාර්තා විය. 2021 වසරේ මැයි මාසය තුළ වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් පැමිණි රටවල් වූයේ චීනය, ජර්මනිය සහ එක්සත් ජනපදයයි. සංචාරකයින්ගේ පැමිණීම් මත පදනම්ව ඇස්තමේන්තු කරනු ලබන සංචාරක ඉපැයීම් 2021 වසරේ මැයි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 2ක් විය. 2021 වසරේ පළමු මාස පහ තුළ සමස්ත සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 21ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, එය 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී එ.ජ. ඩොලර් මිලියන 682ක් විය.

**රූප සටහන 8: මාසික සංචාරක පැමිණීම්**




**මූලය**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

**2021 වසරේ මැයි මාසය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීම් සුළු ප්‍රමාණයක් වාර්තා විය.** 2021 වසරේ පළමු මාස පහ තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 14ක සමස්ත ශුද්ධ ගෙවීමක් වාර්තා විය. රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජන ප්‍රමාණය 2021 වසරේ මැයි මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 23ක අඩු මට්ටමක පැවතුණි. මේ අතර, 2021 වසරේ මැයි මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 12ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. සමුච්චිත පදනම මත, 2021 වසරේ පළමු මාස පහ තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 119ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.

## ජාත්‍යන්තර සංචිත

**2021 වසරේ මැයි මාසය අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 4.0ක් වූ අතර, එය මාස 2.7ක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් විය.** මේ අතර, දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2021 වසරේ මැයි මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 6.8ක් වූ අතර, එම ප්‍රමාණය මාස 4.6ක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් විය. ඉහත වාර්තා කර ඇති සංචිත මට්ටම තුළ චීන මහජන බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කිරීමට යෙදුණු චීන යුවාන් බිලියන 10ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5ක) තුන් අවුරුදු ද්විපාර්ශ්වික මුදල් හුවමාරු පහසුකම ඇතුළත් නොවේ.

**සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

**2021 වසරේ මැයි මාසයේ දී විනිමය අනුපාතිකය සමස්තයක් ලෙස ස්ථාවරව පැවතුණි.** 2021 වසරේ මැයි මාසය තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 0.02කින් සුළු වශයෙන් අතිප්‍රමාණය විය. 2021 වසරේ ජූලි 14වන දින දක්වා කාලය තුළ රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 6.7කින් අවප්‍රමාණය විය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2021 වසරේ ජූලි 14වන දින දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල, යුරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන්, ඕස්ට්‍රේලියානු ඩොලරය සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය විය. ණය නොවන ප්‍රභවයන් තුළින් දළ නිල සංචිත ඉහළ නංවා ගැනීමේ අරමුණ ඇතිව, 2021 වසරේ මැයි මාසයේ දී මෙන්ම මේ දක්වා මෙම වසර තුළ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත විදේශ විනිමය මිළ දී ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව කටයුතු කළේය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2019 | 2020 | 2021 (ජූලි 14 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | +0.6% | -2.6% | -6.7% |
| යුරෝ | +2.6% | -11.2% | -2.6% |
| ස්ටර්ලින් පවුම | -2.8% | -6.2% | -7.9% |
| ජපන් යෙන් | -1.0% | -7.5% | -0.04% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | +1.3% | -11.4% | -3.7% |
| ඉන්දියානු රුපියල | +2.6% | 0.0% | -4.9% |

**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව